ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය
**ජූනි 2016**

# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

**සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව**

*නිෂ්පාදන සහ සේවා කටයුතු වලට අදාල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයෙහි ප්‍රතිඵල*

වැදගත් කරුණු:

- **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** පසුගිය මාස දෙක හා සැසඳීමේදී යහපත් වර්ධනයක් පෙන්නුම් කරමින් 2016 ජූනි මාසයේ දී 55.1 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී. මෙය මැයි මාසය හා සාපේක්ෂව දර්ශක අගයන් 7.2 ක ඉහළ යාමකි. මෙම වර්ධනය සඳහා නිෂ්පාදන සහ නව ඇණවුම් දර්ශකයන්ගේ සැළකිය යුතු වර්ධනය ප්‍රධාන වශයෙන් දායක විය. මීට අමතරව, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය පිළිබඳ දර්ශකය හැර අනෙකුත් සියලුම උප දර්ශක මැයි මාසයට සාපේක්ෂව වර්ධනයක් වාර්තා කරන ලදී. තවද, සේවා නියුක්ති දර්ශකය හැරුණු කොට, සියලුම උප දර්ශක කඩයිම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50 ට වඩා වැඩි අගයක් වාර්තා කරන ලදී. මේ අතර, ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ ඉදිරි අපේක්ෂාවන් ද යහපත් වර්ධනයක් පෙන්නුම් කරයි.

- **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** ජූනි මාසයේ දී 56.3 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී. මැයි මස වාර්තා වූ 58.1 ක අගය හා සසඳන විට ජූනි මාසයේ දී සේවා අංශයෙහි ආර්ථික ක්‍රියාකාරකම්හි වර්ධනයක් සිදු වුවද එය ආන්තික වශයෙන් සිදු වූ වර්ධනයක් බව පෙන්නුම් කරයි. ලක්ෂ්‍යමය පදනම මත සලකා බලන කල මෙය දර්ශක අංක 8.7 ක පහත වැටීමකි. ආර්ථික ක්‍රියාකාරකම්හි වර්ධන වේගය අඩුවීම, නව ව්‍යාපාර, සේවා නියුක්තිය , නිම කිරීමට නියමිත කාර්යයන් හා අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් යන අංශයන්හි දක්නට ලැබිණි. මේ අතර ව්‍යාපාර ක්‍රියාකාරකම් උප දර්ශකයෙහි සුළු වර්ධනයක් ජූනි මාසයේ දී පෙන්නුම් කරන ලදී. දර්ශකය ගණනය කිරීමේ දී සලකා නොබලන අය කරන මිල ගණන් උප දර්ශකය ජූනි මාසයේ දී පහත වැටිණි. එමගින් මිල ඉහළ යාමේ වේගය ජූනි මාසයේ දී පහත වැටුණු බව අනාවරණය විය.

| වර්ෂය | මාසය | නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය | සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය |
|---|---|---|---|
| 2015 | මැයි | 67.3 | 66.8 |
| | ජූනි | 57.5 | 65.0 |
| | ජූලි | 55.5 | 60.6 |
| | අගෝස්තු | 56.5 | 59.8 |
| | සැප්තැම්බර් | 53.2 | 61.7 |
| | ඔක්තෝබර් | 57.8 | 59.5 |
| | නොවැම්බර් | 54.8 | 59.3 |
| | දෙසැම්බර් | 57.9 | 60.2 |
| 2016 | ජනවාරි | 51.9 | 58.0 |
| | පෙබරවාරි | 55.3 | 59.3 |
| | මාර්තු | 60.7 | 61.6 |
| | අප්‍රේල් | 41.6 | 54.7 |
| | මැයි | 47.9 | 58.1 |
| | ජූනි | 55.1 | 56.3 |


නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය
100.0
50.0
0.0
67.3
57.5
55.5
56.5
53.2
57.8
54.8
57.9
51.9
55.3
60.7
41.6
47.9
55.1
මැයි
ජූනි
ජූලි
අගෝ.
සැප්.
ඔක්.
නොවැ.
දෙසැ.
ජන.
පෙබ.
මාර්තු
අප්‍රේල්
මැයි
ජූනි
2015
2016
නව ඇණවුම් දර්ශකය
නිෂ්පාදන දර්ශකය
සේවා නියුක්ති දර්ශකය
ගැනුම් තොග දර්ශකය
ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාල දර්ශකය
නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය


සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය
100.0
50.0
0.0
66.8
65.0
60.6
59.8
61.7
59.5
59.3
60.2
58.0
59.3
61.6
54.7
58.1
56.3
මැයි
ජූනි
ජූලි
අගෝ.
සැප්.
ඔක්.
නොවැ.
දෙසැ.
ජන.
පෙබ.
මාර්.
අප්‍රේ.
මැයි
ජූනි
2015
2016
නව ව්‍යාපාර දර්ශකය
ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය
සේවා නියුක්ති දර්ශකය
නිම කිරීමට නියමිත කාර්යයන් දර්ශකය
අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය
සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

තාක්ෂණික සටහන:

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශයෙහි ක්‍රියාකාරකම පසුගිය මාසය හා සැසදීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශයෙහි ක්‍රියාකාරකම පසුගිය මාසය හා සැසදීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශයෙහි ක්‍රියාකාරකම පසුගිය මාසය හා සැසදීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍යය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.